## දෙමුහුම් වම්බටු *(Solanum melongena L.)*
**සොලනේසියේ කුලය**

### දේශගුණික අවශ්‍යතා

මුහුදු මට්ටමේ සිට මීටර් 1300 දක්වා උච්චත්වයක වසර පුරාම වගාකල හැක. දිවා කාලයේ සාමාන්‍ය උෂ්ණත්වය $27^0C$ -$32^0C$ පමණද රාත්‍රි කාලයේ සාමාන්‍ය උෂ්ණත්වය $21^0C$ - $27^0C$ යෝග්‍ය වේ.

### පාංශු අවශ්‍යතා

පී.එච්. අගය 5.5 - 6.8 අතර වන මනා ජල වහනයක් ඇති පසක් ඉතා යෝග්‍ය වේ.

### වගා කාල

යල - අප්‍රේල්, මැයි
මහ - නොවැම්බර්, දෙසැම්බර්

### නිර්දේශිත ප්‍රභේද

**එස්.එම්. 164**

ඵලය මධ්‍යම ප්‍රමාණයෙන් යුක්තවන අතර, හැඩයෙන් සිලින්ඩරාකාර වේ. බැක්ටීරියානු හිටුමැරීමේ රෝගයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී වේ.
- සාමාන්‍ය අස්වැන්න හෙක්.ට මෙ.ටො. 15 - 18

**පාදාගොඩ ප්‍රභේදය (BW 11)**

ඵලාවරණය සුදු පැහැති ඉරි සහිතවන අතර, රෝග හා පළිබෝධ හානිවලට වැඩි ප්‍රතිරෝධීතාවයක් දක්වයි.
- සාමාන්‍ය අස්වැන්න හෙක්.ට මෙ.ටො. 20 - 25

**තින්නවේලි දම්**

ඵලය තද දම්පාට වන අතර, දිගටි හැඩයකින් යුක්ත වේ.
- සාමාන්‍ය අස්වැන්න හෙක්.ට මෙ.ටො. 20 - 25

### දේශීය දෙමුහුම් ප්‍රභේද

2005 වර්ෂයේ අවසාන භාගයේ පලමු ප්‍රභේද 02 හඳුන්වා දිම.

**අමන්දා**

අධික ලෙස මල් ඇතිවන මෙම ප්‍රභේදයේ ඵලය දම්පාට දිලිසෙන ස්වභාවයකින් හා දිගටි හැඩයකින් යුක්තවන අතර, ඕනෑම කලාපයකට යෝග්‍ය වේ. බැක්ටීරියානු හිටුමැරීමේ රෝගයට මධ්‍යස්ථව ප්‍රතිරෝධී වේ.
- සාමාන්‍ය අස්වැන්න හෙක්.ට මෙ.ටො. 35 - 40




**අංජලී**

ඵලය තද දම් පැහැති මධ්‍යම ප්‍රමාණයෙන් යුක්ත වන අතර, හැඩයෙන් දිගටි සිලින්ඩරාකාර වේ. ලංකාවේ ඕනෑම කලාපයක වගා කිරිමට යෝග්‍ය වන අතර, බැක්ටීරියානු හිටුමැරීමේ රෝගයට ප්‍රතිරෝධී වේ.
- සාමාන්‍ය අස්වැන්න හෙක්.ට මෙ.ටො. 40 - 45




**හෝඩි ලේන ඉරි**




2012 වර්ෂයේදි හඳුන්වා දෙන ලද සුදු පසුබිමේ දම් පැහැ ඉරි සහිත ලංකාවේ ඕනෑම කලාපයක වගාව සඳහා සුදුසු දෙමුහුන් ප්‍රභේදයකි. බැක්ටීරියානු හිටු මැරීමට මධ්‍යස්ථ ලෙස ප්‍රතිරෝධිය.
- සාමාන්‍ය අස්වැන්න හෙක්.ට මෙ.ටො. 35 - 40

### බීජ අවශ්‍යතාවය

ප්‍රරෝහන ප්‍රතිශතය 75% ක් පමණ වන බීජ යොදා ගන්නා විට හෙක්ටයාරයකට බීජ ග්‍රෑම් 200 (ග්‍රෑම් 1 ක බීජ 200 පමණ අඩංගු වේ) දෙමුහුන් වර්ග වගා කිරීමේදි සෑම කන්නයකදිම අළුත් බීජ රෝපණ ද්‍රව්‍ය ලෙස යොදා ගත යුතු වේ.

### පැළ සිටුවීම

ක්‍රමවත්ව සකස්කල තවානක බීජ පැළකොට සති 3 - 4 පමණ වයස්ගත වූ නිරෝගි පැළ ක්ෂේත්‍රයේ සිටුවීම සඳහා යොදා ගනී.

### පරතරය

පැළ අතර සෙ. මී. 60     පේළි අතර සෙ. මී. 90

### යොදන පොහොර

| යොදන අවස්ථාව | පොහොර ප්‍රමාණය කි.ග්‍රෑම්/හෙක්.ට | | |
|---|---|---|---|
| | යූරියා | ට්‍රිපල් සුපර් පොස්පේට් | මියුරියේට් ඔෆ් පොටෑෂ් |
| මුලික පොහොර | 75 | 325 | 80 - 85 |
| මතුපිට පොහොර | | | |
| සිටුවා මාස 1 පසු | 75 | - | - |
| සිටුවා මාස 2 පසු | 75 | - | 85 |
| සිටුවා මාස 3 පසු | 75 | - | - |

### ජල සම්පාදනය

වියළි කාලගුණයක් ඇතිවිට අවම වශයෙන් දින පහකට වරක්වත් ජල සම්පාදනය කළ යුතුය.

### වල් පැළ පාලනය

වර්ධක අවස්ථාවේ දින 2 - 3 වරක් සහ පැළ සිටුවා සති 2, 4, 7, 9, 12 දි වල් පැළ පාලනය කළ යුතුය.

## වම්බටු වගාවේ ප්‍රධාන පළිබෝධ

### එල හා කරටි විදින පණුවා

වම්බටු ශාකයේ කරටි මැලවීයාම හා කැඩී එල්ලා වැටීම සිදුවන අතර, එල මත ආහාර ලබා ගැනීම සඳහා ඇතිකල සිදුරු දැකගත හැකිවේ.







පාලනය

- නිර්දේශිත පරතරයට පැළ සිටුවීම
- හානියට ලක්වී ඇති එල හා කරටි කඩා වලලා දැමීම
- හානිය අධික නම් කෘමිනාශක යෙදීම.

| | | |
|---|---|---|
| 01. | ස්පිනෙටොරාම් | 3 g/10 l |
| 02. | ෆ්ලුබෙන්ඩිමයිඩ් | 20% WG 6 g/10 l |
| 03. | ලැම්ඩා සයියොලෝත්‍රින් | 600 - 825 ml/ha |

### මයිටාවන්

පත්‍ර යටි පැත්තේ රතු දුඹුරු පාටවී තිබෙනු දක්නට ඇත. පත්‍ර වියළී මැරී යයි. කෘමිනාශක වැඩිපුර යෙදීමෙන් ගහනය වැඩිවේ.

පාලනය

- ක්ෂේත්‍රය පිරිසිදුව තබා ගැනීම
- ක්‍රමානුකූලව ජල සම්පාදනය
  - පත්‍ර යටි පැත්තට වැදෙන සේ සල්ෆර් 80-85% තෙ.කු. යෙදීම

### පත්‍ර කීඩෑවන්

පත්‍ර රැළි වැටී, වකුටු වීම සිදුවන අතර, පත්‍රදර කහපාට වී, පිළිස්සුනු ස්වභාවයක් ගනී. පත්‍ර කුඩාවීම සිදුවන අතර, ශාකයේ වර්ධනය දුර්වල වේ.

පාලනය

- නියමිත පරතරයට පැළ සිටුවීම
- ක්ෂේත්‍රය වල් පැළෑටි වලින් තොරව තබා ගැනීම
- හානිය අධික නම් කෘමිනාශක යෙදීම

| | | | |
|---|---|---|---|
| 01. | ඇසිටම්ප්‍රිඩ් | 200 g/l | 10 ml/10l |
| 02. | ඉමිඩක්ලෝෆ්‍රිඩ් | 75% WG | 1.5 g/10 l |
| 03. | තයෝසයික්ලැම් | 50% SP | 25 g/10 l |

## වම්බටු වගාවේ රෝග

### පාදස්ථ කුණුවීම සහ මුල් කුණුවීම

ශාක කඳේ පසට ඉතාමත් ආසන්න ප්‍රදේශයේ මෘදු කුණුවීමක් දක්නට ලැබේ. මුල් දුර්වර්ණ වීම, ශාක වායව කොටස් මැලවී මැරී යාම සිදුවේ.

පාලනය

- ආසාදිත ශාක ගලවා විනාශ කරන්න
- ක්ෂේත්‍රයේ ජලවහනය දියුණු කරන්න
- නිර්දේශිත දිලීර නාශකයක් පසට යොදන්න

### ඇන්ත්‍රැක්නෝස්

වායුගෝලීය ආර්ද්‍රතාව වැඩි අවස්ථාවේදී, පැළවල දුඹුරු පැහැති තෙත ගතියකින් යුක්ත රවුම් පුල්ලි දක්නට ලැබේ.

පාලනය

- නියමිත පරතරයට පැළ සිටුවීම
- ක්‍රමානුකූල ජල සම්පාදනය
- හානිය අධික නම් දිලීරනාශක යෙදීම - ඇන්ට්‍රකෝල්

**දෙමුහුම් බෝග වගා කොට එම බෝගයෙන් ඊළඟ කන්නය සඳහා බීජ ලබාගැනීම නොකල යුතුය. දෙමුහුම් වර්ග දෙවන පරම්පරාවේදී හා ඉන්පසුව ක්‍රමයෙන් දුර්වල වේ. එමනිසා ස්වයං බීජ නිෂ්පාදනය සඳහා දෙමුහුම් වර්ග යෝග්‍ය නොවේ.**

තාක්ෂණික තොරතුරු
ආචාර්ය හේමාල් ෆොන්සේකා, අධ්‍යක්ෂ, (උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන)
ආර්.එම්.සී. රත්නායක (පර්යේෂණ සහකාර)
පී.එච්. රණවීර (වැඩසටහන් සහකාර)
කෞශල්‍යා විතානගේ (තාක්ෂණ සහකාර)
වී. වෙල්ලේගම (පර්යේෂණ නිලධාරී)

සම්බන්ධීකරණය
එච්.ඒ.එස්.එන්. හෙට්ටිආරච්චි

විමසීම්
එළවළු භෝග අංශය,
උද්‍යාන භෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය, ගන්නොරුව, පේරාදෙණිය.
දුක : 081 2388011 - 13

සැකසුම : ශ්‍රව්‍ය දෘශ්‍ය මධ්‍යස්ථානය, ගන්නොරුව, පේරාදෙණිය
මුද්‍රණය : කෘෂි ප්‍රකාශන ඒකකය, ගන්නොරුව, පේරාදෙණිය

# දෙමුහුම් වම්බටු



කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි
2015